


# කාන්තාවන්ට එරෙහි හිංසනය වාර්තා කිරමේ නව මාර්ගෝපදේශ

කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය පිළිබඳව වාර්තා කරන වික්ටෝරියානු ප්‍රවෘත්ති වාර්තාකරුවන්ට උපකාරී වන නව ධමර ද්විජය මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය වාර්තා කරන්නේ කෙසේද? යන ශීර්ෂයෙන් යුත් මෙම මාර්ගෝපදේශය සකසා ඇත්තේ වික්ටෝරියානු Department Of Health and Human Services හි මූල්‍ය ආධාර යටතේය. හිංසනයට ස්ත්‍රීපුරුෂ භාවය මුල් වූ අවස්ථා සම්බන්ධ ප්‍රවෘත්ති/වෘත්තාන්ත වලට අදාළ තොරතුරු වඩාත් යෝග්‍ය ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව වාර්තාකරුවන්ට, සංස්කාරකවරුන්ට සහ අධ්‍යක්ෂකවරුන්ට ප්‍රායෝගික උපදේශ සපයයි.

මෙම මාර්ගෝපදේශ ආදිවාසී සහ ටොරස් ස්ට්‍රේට් දූපත්වාසීන් වශයෙන් හඳුන්වාගන්නා කාන්තාවන්ට, සහ එක් ආකාරයකට වඩා වෙනස්කම් සැලකීම් අත්දකින වෙනත් කණ්ඩායම් වලට අයත් කාන්තාවන්ට එරෙහිව ක්‍රියාත්මක හිංසනාපරාධවල සංකීර්ණතාවන් ගැන වඩා ගැඹුරු අවබෝධයක් පත්‍රකලාවේදීන්ට ලබා දීමද අරමුණු කරයි.
වෘද්ධ කාන්තාවන්ට, සාංක්‍රමණික සහ සරණාගත කාන්තාවන්ට, ආබාධයන් සහිතව ජීවත්වන කාන්තාවන්ට සහ LGBTIQ+ වශයෙන් තමන්ව හඳුනාගන්නා කාන්තාවන්ට එරෙහිව ක්‍රියාත්මක වන හිංසන ක්‍රියා පිළිබඳව වාර්තාකරණය සම්බන්ධ මඟ පෙන්වීම් ඒවාට ඇතුළත් වේ.
Our Watch දූත Taraing Chawla ඔහුගේ සොහොයුරිය වූ Nikitha ව මරා දමන ලද අවස්ථාවේ සහ ඉන් අනතරුව ඇයව මරා දමන ලද පුද්ගලයාගේ නඩු විභාගය අතරතුරදී හානිකර වාර්තාකරණයක් අත්දුටුවේ ය.

එතැන් පටන් ඔහු සංවේදී, සාක්ෂ්‍ය මත පදනම් වන වාර්තාකරණයක අවශ්‍යතාවය පිළිබඳ දැනුවත්කම වැඩි දියුණු කිරීමට වැඩ කළේය.

Tarang විස්තර කරන ආකාරයට "Niki" ව ඝාතනය කරන ලද අවස්ථාවේදී බොහෝ මාධ්‍ය වාර්තාකර තිබුණේ ඇයගේ සමේ පැහැය පිළිබඳව, අපේ සංස්කෘතික පසුබිම පිළිබඳව හෝ "සංස්කෘතිය" හෝ "ගරු ඝාතනය" වැන්නක් පදනම් කරගෙන, යම් ආකාරයකට අපරාධකරුවාගේ සාපරාධී ක්‍රියාව සම්බන්ධ වගකීමෙන් නිදහස් කරන ආකාරයේ ප්‍රවෘත්ති. ඒත් ඒක එක් මිනිහෙක් කාන්තාවකගේ ජීවිතය පැහැර ගැනීමක් විතරයි"
අපි වගකීමක් සහිත මාධ්‍ය වාර්තාකරණයක් කියවන විට, කාන්තාවන්ට එරෙහි පුරුෂයන්ගේ හිංසනය පසුපස ඇති ධාවක බලවේගය අපට වැටහෙයි. එසේම ලිංගික ආකල්ප සහ ඊට මුල් විය හානිකර ඒක කෘතීන්ට එරෙහිව හැමෝම ඉටු කරන ක්‍රියා කළාපය අපට වැටහෙයි.

"නමුත් මාධ්‍යය මෙය නොකරන විට, අවාසනාවකට ප්‍රජාව තුළ අපේ අවබෝධය නොපැහැදිලි තත්වයකට පත් වෙනවා. ඒ විතරක් නෙවෙයි, අපි අඩු නිවැරදිභාවයක් සහිත, හේතු සොයාගන්න උත්සාහ කරනවා වගේම මෙම අපරාධ වල තේරුම කුමක් ද යන්න තේරුම් ගැනීමේ මං" ඕර්බට කීවේය.
කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය වාර්තා කරන්නේ කෙසේ ද? යන්න සකසා ඇත්තේ වික්ටෝරියානු මාධ්‍යයේ සිටින ජ්‍යේෂ්ට නියමුවන් සහ ආදිවාසික ප්‍රජාවන් මෙන්ම වැඩිහිටි කාන්තාවන් නියෝජනය කරන අය. සාංක්‍රමණික සහ සරණාගත කාන්තාවන්, ආබාධයන් සහිතව ජීවත්වන කාන්තාවන් සහ LGBTIQ+ වශයෙන් තමන්ව හඳුනාගන්නා කාන්තාවන්ගෙන් සමීපව උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුවය.

මෙම මාර්ගෝපදේශනය ඉලක්ක කර ගන්නේ සංස්කාරකයන්, නිෂ්පාදකයන් ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරුන්, පුවත්පත් වාර්තාකරුවන්, ඡායාරූප ශිල්පීන්, වීඩියෝ කැමරා ශිල්පීන් සහ වික්ටෝරියාවේ රූපවාහිනිය, ගුවන් විදුලිය, ජාල ගත සහ මුද්‍රිත මාධ්‍ය වල සේවය කරන වෙනත් වෘත්තිකයින් වන අතර එය භාෂා 15 කින් ප්‍රකාශයට පත් වී ඇත.

වැඩිදුර විස්තර සඳහා සහ මාර්ගෝපදේශනය නොමිලේ භාගත කර ගැනීම සඳහා, මෙතැන ක්ලික් කරන්න.

**මාධ්‍ය ඇමතුම්**
Saraya Musovic
Saraya.musovic@ourwatch.org.au
0407091383
Our Watch udOHh 0448844930

"ඔබ කාන්තාවන් සහ ළමුන්ට එරෙහි හිංසනය සම්බන්ධ මෙම ප්‍රවෘත්තිය/කතාව හෝ වෙනත් ප්‍රවෘත්තීන්/කතාවන් ආවරණය කරන්නේ නම් පහත සඳහන් වන හැඳුනුම් වාක්‍යය ඇතුලත් කරන්න."

"ඔබ හෝ ඔබ දන්නා වෙනත් අයෙක් ලිංගික අඩම්තේට්ටම්, පවුල් හෝ ගෘහස්ථ හිංසන යෙහි බලපෑමට නතු වන්නේ නම්, 1800 737 732 අංකය ඔස්සේ 1800RESPECT අමතන්න.නැත්නම් www.1800RESPECT.org.au වෙබ් අඩවියට පිවිසෙන්න. හදිසි අවදානම් අවස්ථාවක දී 000" අමතන්න.
කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය වාර්තාකරණයට අදාල මාර්ගෝපදේශනයට ප්‍රවේශ වන්නට, අඅඅග දමරඅ්විජයගදරටග්ම වෙබ් අඩවියට පිවිසෙන්න.

## Social Media Copy

කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය අවසන් කරමු.
කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි හිංසනය වාර්තා කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳව ධමර ද්විජය මඟින් මාර්ගෝපදේශයක් පිළියෙල කර ඇත.
ඔබේ භාෂාවෙන් තොරතුරු සොයා ගැනීම සඳහ මෙතැන ක්ලික් කරන්න.
URL : https://www.ourwatch.org.au/What-We-Do/How-to-report-on-violence-against-women-and -their




06 වන පිටෙන්

ධනු තමන්ට හිතවත් මැරයන් පිරිසක් සමග වෙනම පාතාල කල්ලියක් බිහිකර ගත්තේය. මේ කල්ලිය හැඳින්වූයේ ධනුරොක්ස් ගෑෑප් යනුවෙන්ය. ධනුගේ පෙම්වතිය රොක්ස් නම් විය. තම පෙම්වතියගේ නමේ කොටසක්ද පාවිච්චි කරමින් ධනු අලූත් පාතාල කල්ලිය ධනුරොක්ස් ගෑෑප් යනුවෙන් බිහිකර ගත්තේය.

එතැන් පටන් ධනුරොක්ස් කල්ලියේ ප්‍රධානම හතුරා බවට පත්ව සිටියේ ආවා ගෑෑප් කල්ලියයි. මේ කල්ලි දෙක අතර නිරන්තර ගැටුම් හටගත්තේය.

ඇතැම් අවස්ථාවල මේ ගැටුම්වලට හේතු වුණේ සමාජ ජාලා වෙබ් අඩවිවල පළකළ නොයෙකුත් කෝප කරවන සුළු පුවත්ය. තවත් අවස්ථාවල මොවුන් අතර ගැටුම් ඇතිවන්නට බලපෑවේ තරුණියක පිළිබඳ ගැටලූය.

මේ පාතාල කල්ලිවල සාමාජිකයන් පරිහරණය කළේ රුපියල් ලක්ෂ 4 - 5 වටිනා යතුරුපැදිය. ඔවුන්ගෙන් බහුතරයක් සතුව තිබුණේ ඇපල් වර්ගයේ මිල අධික ජංගම දුරකථනයන්ය.

විරැකියාවෙන් පෙළෙන මේ තරුණයන් මෙතරම් විශාල වටිනාකම් ඇති යතුරුපැදි ජංගම දුරකථන පරිහරණය කරන්නේ කෙසේද යන්න විශාල ගැටලූවකි.

විමර්ශනවලින් හෙළිවී ඇති අන්දමට මේ කල්ලිවලට සම්බන්ධ වී සිටින තරුණයන්ගෙන් බහුතරයකගේ ඥාතියකු හෝ මිතුරකු විදේශ රැකියාවල නිරත වී සිටිති. මේ රස්තියාදුකාරයන් අතට මුදල් ලැබෙන්නේ විදේශගතව සිටින තම නෑ හිතමිතුරන්ගෙන්ය.

ධනුරොක්ස් කල්ලියේ නායකත්වය දුන් ධනු මේ වන විට සිටින්නේ විදේශගත වීමට සිහින මවමින්ය. මොහු තොරතුරු තාක්ෂණ විෂය හදාරමින් සිටින්නේය. පාතාල කල්ලි පිළිබඳ ඔහු තුළ ඇත්තේ අම්හිරි අත්දැකීමක් පමණය.

'ආවා කල්ලියේ වර්තමාන නායකයා ලෙස හඳුන්වන අශෝක් කන්කසන්තුරේ ප්‍රදේශයේ වෙළෙඳසලක් පවත්වාගෙන යන්නේය. අශෝක් ආවා කල්ලිය ප්‍රබල තැනකට ගෙන ඒමට උත්සාහ කරමින් සිටියි.

මේ වන විට ආවා කල්ලියට සහ ධනු රොක්ස් කල්ලියට සම්බන්ධ වී සිටින්නේ යාපනය නගරයේ පාසල් හැර ගොස් සිටින ලාබාල තරුණයන්ය.පාසල් හැර යන ලාබාල තරුණයන් මෙවැනි පාතාල කල්ලිවලට සම්බන්ධ වීම සැබැවින්ම මහා අපරාධයකි.

යාපනයේ පාතාල කල්ලි මර්දනය කිරීම සඳහා කටයුතු කරන අතරම එම තරුණයන් පාතාල කල්ලිවලට යොමුවන්නේ මන්දැයි යන්න පිළිබඳව ද සොයා බැලිය යුතුය.

තරුණ පිරිස් මෙවැනි සන්නද්ධ කල්ලිවලට යොමුවීම නතර කිරීමට කටයුතු නොකරන්නේ නම් ඉදිරියේදී දරුණු තත්ත්වයන්ට මුහුණදීමට සිදුවන්නේය.

